**මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 2 අදියර - 2023**

---

මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩ සටහනේ - 2 අදියරේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන කොළඹ මහානගර සභාව සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 ජුනි 03 දින එළඹි අංක 3030 දරන ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.10 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

ණය ගිවිසුමට අනුව, එවකට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහානගර සභාව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජල සේවා කළමනාකරණය කිරීම සහ මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදනය හා අපජල සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. ණය ගිවිසුම ප්‍රකාරව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,230.60කට සමාන එජඩො මිලියන 9.44ක් වන අතර ඉන් රු.මිලියන 1,042.88කට සමාන එජඩො මිලියන 08ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යායනය කිරීමට එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 187.72කට සමාන එජඩො මිලියන 1.44ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. වැඩසටහන එහි කාර්යයන් 2014 සැප්තැම්බර් 23 දින ආරම්භ කරන ලද අතර 2019 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් තිබුණි. කෙසේවෙතත්, වැඩසටහනේ කටයුතු අවසන් කිරීමේ දිනය 2022 ඔක්තෝබර් 24 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

[

වැඩසටහනේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්**

**2.1 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත | පළාත් සභා සහ පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් කොන්ත්‍රාත්කරු සමඟ අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුමේ 14.1 වගන්තියට අනුව, 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත යටතේ බදු ප්‍රතිපූරණය කිරීම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ කොන්ත්‍රාත්කරුට රු. මිලියන 11ක් ගෙවා තිබුණි. | පිඩික් (FIDIC) පොදු කොන්දේසි 13.7 සහ 20.1 වගන්ති යටතේ ගෙවීම් කර ඇත. | අධිකාරය නොලත් ගෙවීම් අයකර ගත යුතුය. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත | සෑම මූල්‍ය වර්ෂයක්ම අවසන් වී මාස තුනකට නොඅඩු කාලයකදී මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේවෙතත්, මාස 3 කට පසුව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | අදහස් දක්වා නොමැත | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කළ යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| සංරචකය | 2023 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | ප්‍රමාදය සඳහා හේතු |
|---|---|---|---|---|
| | අපේක්ෂිත භෞතික කාර්ය සාධනය ප්‍රතිශතය | අත්කරගත් කාර්ය සාධනය ප්‍රතිශතය | | |
| (අ) සැලසුම්කරණය, අධීක්ෂණය, ආයතනික සංවර්ධන උපදේශකයින් | 100 | 65 | I. වැඩසටහන 2014 ජූනි 3 දින ආරම්භ කර 2019 ජූනි 30 දින අවසන් කිරීමට නියමිතව තිබුණද, අවසාන දිනය 2022 ඔක්තෝබර් 24 දක්වා දෙවරක් දීර්ඝ කර ඇත. 2022 ඔක්තෝබර් 24 වන විට ව්‍යාපෘතියේ සමස්ථ ප්‍රගතිය සියයට 57.27 විය. | කොන්ත්‍රාත් පරිපාලනයේ, ව්‍යාපෘති ප්‍රතිපාදන, ශක්‍යතා අධ්‍යයනය, පරිසරික තක්සේරුව, ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ දුර්වලතා හේතුවෙන් මෙම වැඩසටහන මන්දගාමී වැඩසටහනක් ලෙස වාර්තා වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කෙසේවෙතත්, වැඩසටහනේ සම්පූර්ණ නොකළ ව්‍යාපෘති ප්‍රතිදානයන් පැවතියදී අවසන් කරන ලදි. | |
| | | | II. උපදේශන සමාගමක් තෝරා ගැනීම සඳහා මුළු ව්‍යාපෘති කාලයෙන් සියයට 33ක් කාලයක් ගත කර ඇත. කෙසේවෙතත්, එකඟ වූ කාල සීමාව තුළ උපදේශක සමාගමට කටයුතු නිම කිරීමට නොහැකි වී ඇත. එවිට කොන්ත්‍රාත්තුව වර්ෂ 2 1/2 කින් දෙවරක් දීර්ඝ කර ඇත. | කොන්ත්‍රාත් පරිපාලනයේ, ව්‍යාපෘති ප්‍රතිපාදන, ශක්‍යතා අධ්‍යයනය, පරිසරික තක්සේරුව, ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ දුර්වලතා හේතුවෙන් මෙම වැඩසටහන මන්දගාමී වැඩසටහනක් ලෙස වාර්තා වී ඇත. |
| (ආ) මාදම්පිටියේ අපජල පවිත්‍රාගාරය | 100 | 97 | මාදම්පිටිය අපජල පවිත්‍රාගාරයේ ඉදිකිරීම් ප්‍රමාද වීම හේතුවෙන් දිනකට පොම්පාගාරයට ලැබෙන අපජලය ඝන මීටර් 95,000ක් පමණ කිසිදු පවිත්‍රකරණයකින් තොරව මුහුදට මුදා හැරීමට සිදුව ඇති බව නිරීක්ෂණය විය. | අපජල පවිත්‍රාගාරය ඉදිකිරීමට අවශ්‍ය ඉඩම 2023 දෙසැම්බර් 31 දින වන විට නාගරික සංවර්ධන අධිකාරියෙන් පවරාගෙන නොතිබූ අතර අරමුදල් නොමැතිකම හේතුවෙන් පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව සකස් කිරීම තාවකාලිකව නතර කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) උතුරු ජල පෝෂක ප්‍රදේශයේ පහසුකම් නොමැති ප්‍රදේශ 7ක් සඳහා මලාපවහන පහසුකම් සැපයීම | 100 | 91 | පොම්පාගාර ස්ථානයේ භූ විෂමතා සමීක්ෂණ සහ මාර්ග ජාලය සඳහා කොන්ත්‍රාත්තුව අවසන් කර ඇත. කෙසේවෙතත්, භූ තාක්‍ෂණික විමර්ශනය සඳහා වන කොන්ත්‍රාත්තුව සඳහා ලංසු තැබීම අවසන් වී නොතිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට උපදේශන කොන්ත්‍රාත්තු පිරිවැය පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකළ අතර 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රමාද කාලය මාස 51ක් පමණ විය. | අමතර ණය පහසුකම් නොමැතිවීම හේතුවෙන් මෙම ක්‍රියාකාරකමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තාවකාලිකව නවතා ඇත. |
| (ඈ) උතුරු ජල පෝෂක ප්‍රදේශයේ දැනට පවතින කුඩා පොම්පාගාර 5ක් පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම | 100 | 69 | කොළඹ මහනගර සභාව ඔවුන්ගේම අරමුදල් මගින් තත්ත්ව තක්සේරුව සිදු කිරීමට තීරණය කර තිබුණද, 2023 දෙසැම්බර් 31 දිනට තත්ත්වය තක්සේරු සිදුකිරීම ආරම්භ කර නොතිබුණි. | සංවර්ධන කටයුතු සඳහා අරමුදල් නොමැති වීම. |
| (ඉ) මල්ලිගාවත්තේ සිට මාදම්පිටිය පොම්පාගාරය දක්වා මූලික බදක් සහිත මලාපවහන ඉදිකිරීම | 100 | 91 | 2023 දෙසැම්බර් 31 වන විට ප්‍රමාද කාලය මාස 51කට ආසන්න වේ. | අරමුදල් සීමාවීම හේතුවෙන් වේ. |
| (ඊ) උතුරු ජල පෝෂක ප්‍රදේශයේ මලාපවහනය පද්ධතිය වැඩිදියුණු කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ අලුත්වැඩියා කිරීම. | 100 | 82 | 2019 සැප්තැම්බර් 28 වන දින කෙටුම්පත් ලංසු ලියවිලි සමාලෝචනය සඳහා ආසියානු සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කරන ලද නමුත් එය අනුමත කර නොමැති අතර භූගෝලීය සමීක්ෂණ ප්‍රදානය කිරීම ප්‍රමාද වී ඇත. | අරමුදල් සීමාවීම හේතුවෙන් වේ. |

| | |
|---|---|
| **කළමනාකරණයේ අදහස් දැක්වීම** | මලාපවහන පද්ධති සංවර්ධනය පිළිබඳ දැනුම ඇති උපදේශකයින් තෝරා ගැනීම දුෂ්කර කාර්යයක් වීම, අරමුදල් නොමැතිකම සහ කෙරීගෙන යන කොන්ත්‍රාත්තුවල දුර්වල ප්‍රගතිය ප්‍රමාද වීමට හේතු විය. |
| **විගණකගේ නිර්දේශ** | ප්‍රතිපාදන වෙන්කර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණනය නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීම හේතුවෙන් මුළු උපදේශන වියදම් ඩොලර් මිලියන 5.29 දක්වා සියයට 61 කින් ඉහළ ගොස් ඇත. කෙසේවෙතත්, අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට නොහැකි වී තිබුණි. | දීර්ඝකිරීම නිසා උපදේශන පිරිවැය වැඩි වී ඇති බව සත්‍යක් වේ. නමුත් කොන්ත්‍රාත්තුවේ මුළු උපදේශකයින් සංඛ්‍යාවෙන් අවම උපදේශකයින් සංඛ්‍යාවක් පමණක් බඳවාගෙන ඇත. එසේම, ඔවුන් කොන්ත්‍රාත්තුවේ මුල් විෂය පථය අයත් නොවූ වරාය නගර සංවර්ධනහි මලාපවහන සම්බන්ධ කිරීමේ සැලසුම් කටයුතු ඔවුන් වෙත පවරා ඇත. කොන්ත්‍රාත්තුවේ ප්‍රතිපාදන අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකයට (CCPI) අනුකූලව වාර්ෂික අනුපාතය වැඩිවීම හේතුවෙන් උපදේශකයින්ගේ පිරිවැය ද වැඩි වී ඇත. | ඉතිරි කටයුතු කොළඹ මහනගර සභාවේ කාර්ය මණ්ඩලය විසින් අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කිසිදු අරමුදල් සම්පාදනයකින් තොරව ව්‍යාපෘතිය අවසන් වන දින සිට මාස 8 කට ඔබ්බට සංවෘත පරිපථ රූපවාහිනී (Closed-Circuit Television) කොන්ත්‍රාත්තුවක් සඳහා සමාගමක් සමඟ ගිවිසුමක් අත්සන් කර තිබුණි. ව්‍යාපෘතිය වසා දැමීම හේතුවෙන් රු. මිලියන 3.12ක අමතර ගෙවීමක් සමඟ සීසීටීවී කොන්ත්‍රාත්තුව 2022 ඔක්තෝබර් 24 වන දින අවසන් කරන ලදී. කෙසේවෙතත්, කිලෝමීටර් 89 ක ගුරුත්වාකර්ෂණ කාණුවලින් කිලෝමීටර් 58 ක් සහ මැන්හෝල් 1974න් මැන්හෝල් 1242ක් නිම කර නොතිබුණි. | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන විට කොන්ත්‍රාත් කාලය ණය අවසන් දිනය ඉක්මවා ඇති බව දන්න කරුණක්වේ. නමුත් කොන්ත්‍රාත්තුවේ ඉතිරි කාලය සම්පූර්ණ කිරීම සඳහා රජයෙන් අමතර අරමුදල් ලබා ගත හැකි බවට අපේක්ෂාවක් තිබුණි. එසේම, ණය කාලය අවසන්වීමට පෙර කොන්ත්‍රාත්තුවේ විෂය පථය උපරිම කිරීම සඳහා වැඩ වේගවත් කිරීම සඳහා අන්‍යොන්‍යය එකඟතාවක් ඇති විය. ඒ අනුව කොන්ත්‍රාත්තුවේ පළමු අදියර සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට හැකි විය. | කොළඹ මහනගර සභාව විසින් තක්සේරු වාර්තාව භාවිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අමාත්‍යාංශ ලේකම්වරයා විසින් උපදේශන සමාගම සමඟ අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, සවිස්තරාත්මක සැලසුම්කරණය, ඉදිකිරීම් අලංකරණය සහ ව්‍යාපෘති කළමනාකරණය කිරීම උපදේශක සමාගම සිදුකිරීම අවශ්‍ය වේ. එසේ වුවද, 2017 මැයි 04 වන දින M/S Larsen and Toubro සමඟ අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, දෙවන කොටස සඳහා පොම්පාගාර ඉදිකිරීම, ප්‍රතිසංස්කරණය, අධි පීඩන නල එළීම | උපදේශකයින් විසින් කොන්ත්‍රාත්තුවේ සවිස්තරාත්මක සැලසුම් සකස් කිරීම කොන්ත්‍රාත්තුවේ ස්වභාවය මත රඳා පවතී. සැලසුම්කිරීම සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලදී, සවිස්තරාත්මක සැලසුම් සඳහා මූලික සැලසුම්කිරීම පමණක් උපදේශකයින් විසින් කරනු ලැබේ. කොන්ත්‍රාත්කරුගේ සැලසුම්කිරීමේ පිරිවැය වෙනම අයිතමයක් ලෙස ප්‍රමාණ පත්‍රයේ ඇතුළත් | ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය විසින් අධ්‍යයනයක් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සහ ගුරුත්වාකර්ෂණ පයිප්ප සඳහා සැලසුම් සකස් කිරීම කොන්ත්‍රාත්කරු වෙත භාර දී ඇත. ඒ අනුව, සැලසුම් කටයුතු සඳහා උපදේශන ආයතනයට ගෙවීම් කරන අතරම එම කාර්යය සඳහා කොන්ත්‍රාත් සමාගමට ද ගෙවීම් සිදු කර ඇති බැවින් එකම කාර්යය සඳහා දෙවතාවක් ගෙවීම් සිදු කරන බව නිරීක්ෂණය විය. | කර ඒ අනුව ගෙවීම් කරනු ලැබේ. එකම කාර්යය සඳහා ද්විත්ව ගෙවීමක් සිදු කර නොමැත. | |
| (ඇ) | උපදේශන සමාගම සමඟ ඇති කර ගත් කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, කාල පදනම අනුව ගෙවීම් සිදු කරනු ලැබේ. ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සහ ඉඩම් නිදහස් කිරීම ප්‍රමාද වීම වැනි හේතු නිසා ඇති වූ කොන්ත්‍රාත් ප්‍රමාදය හා ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් පහත සඳහන් කොන්ත්‍රාත් අධීක්ෂණ කටයුතු සඳහා උපදේශන ආයතනයට ඵල රහිත ගෙවීමක් කර තිබුණි.<br><br>• දැනට පවතින මලාපවහන පද්ධතියේ කිලෝමීටර් 59ක තත්ත්ව පරීක්ෂාවට අදාළ නිර්දේශ ලබා ගැනීම.<br><br>• අර්ධ වශයෙන් නිම කර ඇති තලකොටුව සහ කාලිංග මාවතේ පොම්පාගාර භූගත හා පීඩන මලාපවහන ජාල පද්ධතිය ඇතුළුව අර්ධ වශයෙන් නිම කර ඇති කිලෝමීටර් 22ක් සහ කිලෝමීටර 7ක් සම්පූර්ණයෙන් නල එළීමට අදාළ කොන්ත්‍රාත්තුවේ අධීක්ෂණය.<br><br>• වැල්ලවත්තේ අලුතින් ඉදිකිරීමට නියමිත අපජල පවිත්‍රාගාරයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ අධීක්ෂණය.<br><br>• කිලෝමීටර් 12.4ට වැඩි කිරුළ - නාරාහේන්පිට මලාපවහන ජාල පද්ධතිය සහ පොම්පාගාර දෙකක් ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත්තුව අධීක්ෂණය කිරීම.<br><br>• දකුණු ජල පෝෂක ප්‍රදේශයේ දැනට පවතින අපජල මලාපවහන ජාල පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම අධීක්ෂණය කිරීම. | ව්‍යාපෘතියේ සහ උපදේශන ආයතනයේ පාලනයෙන් ඔබ්බට වූ විවිධ හේතු නිසා මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන යටතේ සැලසුම් කර තිබූ සියලුම කාර්යයන් සම්පූර්ණ කිරීමට නොහැකි විය. | ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය විසින් අධ්‍යයනයක් සිදුකළ යුතුය. |